# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 16 දරන
# ජාතික වටිනාකමක් ඇති
# පුරාවිද්‍යාත්මක ස්ථාන පනත

---

[සහතිකය සටහන් කළේ 1990 අප්‍රේල් මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 අප්‍රේල් මස 20 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිළ: ශත 45 යි. තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

# 1990 අංක 16 දරන ජාතික වටිනාකමක් ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන පනත

[සහතිකය සටහන් කළේ 1990 අප්‍රේල් මස 20 වන දින.]

එල්. ඩී.—ඕ. 2/89

**ඇතැම් පුරාවිද්‍යාත්මක කටයුතු, ස්ථාන සහ නටබුන් පුරාවස්තු, පුරාණ සහ ඓතිහාසික සිහිවටන සහ වාර්තා ජාතික වැදගත්කමක් ඇති ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1990 අංක 16 දරන ජාතික වටිනාකමක් ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** (1) මේ පනතේ පළමුවන උපලේඛනයෙහි විස්තර කර ඇති පුරාවිද්‍යාත්මක කටයුතු, ස්ථාන සහ නටබුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ කාර්ය සඳහා, ජාතික වටිනාකමක් ඇති බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. *ජාතික වටිනාකමක් ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන ආදිය.*

(2) මේ පනතේ පළමුවන උපලේඛනයෙහි විස්තර කර නොමැති වෙනත් යම් පුරාවිද්‍යාත්මක කටයුතු ස්ථාන සහ නටබුන් හෝ යම් පුරාවස්තු ජාතික වටිනාකමක් ඇති බවට අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(3) (අ) (2) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ දී බලාත්මක වන අතර එම නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට, එක් මාසයක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තු රැස්වීමක් නොපවත්වන ලද්දේ නම්, එම නියමය අනුමත කරන ලෙස ඉල්ලා සිටින යෝජනාවක් ද සමග එම නියමය එම කාල සීමාවට පසුව පවත්වනු ලබන පළමු පාර්ලිමේන්තු රැස්වීම් වාරයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) (2) වන උපවගන්තිය යටතේ කරනු ලැබුවා වූ ද පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවා වූ ද යම් නියමයක් එසේ ප්‍රතික්ෂේප කිරීමේ දින සිට බලපවත්වන පරිදි ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලබන නමුත් එය යටතේ කරන ලද යම් කිසිවක වලංගු භාවයට එයින් හානියක් සිදු නො විය යුතු ය. එම නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**3.** (1) මේ පනතේ දෙවන උපලේඛනයේ විස්තර කර ඇති පුරාණ සහ ඓතිහාසික සිහිවටන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ කාර්ය සඳහා ජාතික වටිනාකමක් ඇති බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. *ජාතික වටිනාකමක් ඇති පුරාණ සහ ඓතිහාසික සිහිවටන සහ වාර්තා.*

(2) මේ පනතේ දෙවන උපලේඛනයේ විස්තර කරනු ලැබ නොමැති වෙනත් යම් පුරාණ සහ ඓතිහාසික සිහිවටනයක් හෝ යම් පුරාණ හෝ ඓතිහාසික වාර්තාවක් ජාතික වටිනාකමක් ඇති බවට අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

2—ඩී 004 365—6,730 (89/06)

(3) (අ) (2) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට බලාත්මක විය යුතු අතර එම නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට එක් මාසයක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම කාල සීමාව ඇතුළත පාර්ලිමේන්තු රැස්වීමක් නොපවත්වන ලද්දේ නම් එම නියමය අනුමත කරන ලෙස ඉල්ලා සිටින යෝජනාවක් ද සමඟ එම නියමය, එම කාල සීමාවට පසුව පවත්වනු ලබන පළමු පාර්ලිමේන්තු රැස්වීම් වාරයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) (2) වන උපවගන්තිය යටතේ කරනු ලැබුවා වූ ද පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවා වූ ද යම් නියමයක් එසේ ප්‍රතික්ෂේප කිරීමේ දින සිට බලපවත්වන පරිදි ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන ලෙස සලකනු ලබන නමුත් එය යටතේ කරන ලද කිසිවක වලංගු භාවයට එයින් හානියක් සිදු නො විය යුතු ය. එම නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පළමුවන උපලේඛනය (2(1) වන වගන්තිය)

I වන කොටස

පුරාවිද්‍යාත්මක ස්ථාන සහ නටබුන්

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත යටතේ යම් පුරාවිද්‍යා රක්ෂිත ප්‍රදේශයක් සහ එහි ඇති යම් ස්ථාන හෝ නටබුන්.

II වන කොටස

පුරාවිද්‍යාත්මක කටයුතු

1. ඓතිහාසික වටිනාකමකින් යුක්ත භාණ්ඩ, ශිලාලේඛන, ස්මාරක සහ භූමි ගවේෂණය සහ කැණීම හා එසේ සොයා ගන්නා දේ වාර්තාගත කිරීම.

2. ඓතිහාසික වටිනාකමකින් යුක්ත පෞරාණික ස්මාරක සහ වෙනත් දේපළ හා ඒවායේ සැලැස්ම සහ පරිසරය සංරක්ෂණය කිරීම, ආරක්ෂා කිරීම හා ප්‍රදර්ශනය කිරීම.

3. පුරාණ සහ ඓතිහාසික ස්මාරක පිළිබඳව සහ ඓතිහාසික හා ප්‍රාග් ඓතිහාසික යුගයේ භෞතික සංස්කෘතිය පිළිබඳව පර්යේෂණ පැවැත්වීම සහ ඒවායේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම.

4. පුරා වස්තු ආඥාපනත පිළිබඳ පරිපාලන කටයුතු.

5. ශිලාලේඛන පිළිබඳව පර්යේෂණ පැවැත්වීම, ඒවා පරිවර්තනය කිරීම සහ පළ කිරීම.

6. පුරා විද්‍යා කෞතුකාගාර පිහිටුවා පවත්වාගෙන යාම.

7. පුරා විද්‍යා භූමිවලට සහ කෞතුකාගාරවලට පැමිණෙන ආගන්තුකයන් සඳහා සේවා සැලසීම.

8. පෞරාණික ස්මාරක පිළිබඳ ලේඛනයක් සකස් කිරීම.

දෙවන උපලේඛනය (3(1) වන වගන්තිය)

පෞරාණික සහ ඓතිහාසික ස්මාරක

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ අර්ථානුකූලව, යම් පෞරාණික ස්මාරකයක්.